මගේ අංක :NWP/PDHS/E12/PHI/AnnTrnsf2022
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
කුරුණෑගල.
2022.06.20

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ,
කුරුණෑගල/පුත්තලම,
සියලුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>වාර්ෂික ස්ථානමාරු 2022 - පරිපාලන/මහජන සෞඛ්‍ය පරීක්ෂක</u>

2021.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ වසර 05ක කාලයක් සම්පූර්ණ කරන ලද ස්ථානමාරු ලැබීමට සුදුසුකම් සපුරා ඇති ඔබ කොට්ඨාසයේ සිටින නිලධාරීන්ගේ විස්තර 2022.07.20 දිනට පෙර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කරන්න.

02. 2021.12.31 දිනට වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කළ හා එක් සේවා ස්ථානයක වසර 2ක සේවා කාලයක් සම්පූර්ණ කර, සිය කැමැත්තෙන් ස්ථානමාරු වී යාමට සිටින නිලධාරීන් වේ නම් ඔවුන්ගේ ද විස්තර ඇතුළත් කර, දැනට සිටින ආයතනය හා මහජන සෞඛ්‍ය පරීක්ෂක ක්ෂේත්‍රය හා විශේෂිත ව්‍යාපෘති හා ඊට පත් වූ දිනය ඇතුළත් විස්තර ආයතන ප්‍රධානීන් විසින් මීට අමුණා ඇති උප ලේඛනය මගින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් වෙත ඉදිරිපත් කළ යුතුය.

03. මීට ඉහතදී සුහද ස්ථානමාරු ලබා, ස්ථානමාරු පටිපාටිවල විධිවිධානයන් මත 2021.12.31 දිනට වාර්ෂික ස්ථානමාරුවීම් වලට යටත් විය යුතු නිලධාරීන් ද , මේ වසර තුළ අන්තර් පළාත් ස්ථානමාරු ලබා අනුයුක්ත කර සිටින සියලුම නිලධාරීන්ගේ ද විස්තර ඉහත ලැයිස්තුවට ඇතුළත් විය යුතුය.

04. ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් තමා වෙත ලැබෙන නාම ලේඛන, අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව පරීක්ෂා කර බලා වසර 05 හා 02 සම්පූර්ණ කරන නිලධාරීන්ගේ නාම ලේඛන වෙන වෙනම සකස් කර දැනට පුරප්පාඩු වී ඇති ආයතන ලැයිස්තුවක් ද සමඟ 2022.07.22 දිනට පෙර මා වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී ආයතන ප්‍රධානීන්ගේ ලේඛනවලින් මඟ හැරී ගිය, එහෙත් ඉහත පරිදි මෙම වසරේ ස්ථානමාරුවීම් සඳහා යටත් විය යුතු තවත් නිලධාරීන් වේ නම් ඔවුන්ගේ ද විස්තර මෙම ලේඛනයට ඇතුළත් කිරීමට ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් විසින් කටයුතු කළ යුතුය.

05. ඉහතින් ඉල්ලා ඇති විස්තර නියමිත පරිදි ඉදිරිපත් කිරීම සම්බන්ධව සියලුම ආයතන ප්‍රධානීන් හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් පෞද්ගලිකව අවධානය යොමු කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

වෛද්‍ය එම්.කේ. සම්පත් ඉන්දික කුමාර
MBBS, MSc MD, MCMA
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත,
කුරුණෑගල.

පිටපත:-

01. සභාපති/ ලේකම්, ශ්‍රී ලංකා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ සංගමය ද.පි.

උපලේඛනය

| අනු අංක | නිලධාරියාගේ නම | ආයතනය | ඊට පත්වූ දිනය | මහජන සෞඛ්‍ය පරීක්ෂක ක්ෂෙත්‍රය/ විශේෂිත ව්‍යාපාරය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |